# 1 ජුදා සමාජ දැක්ම

දෙවියන් වහන්සේගේ කැඳවීමට අනුව ආබ්‍රහම්තුමාගේ නායකත්වයෙන් පිහිටුවනු ලැබූ ඉශ්‍රායෙල් ජාතිය, පසුව දසපනත මූලික වූ ජන සමාජයක් ලෙස ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

උත්පත්ති 12: 2-3, 13 : 14-17, 15: 5, නික්මයාම 20: 1-17

## ආබ්‍රහම් කැඳවීම

බබිලෝනියේ සිට සෑම අතින් ම සරුසාර කානාන් දේශය කරා ජන කණ්ඩායම්වල සංක්‍රමණය ක්‍රි. පූ. 19 වන සියවසේ දී සිදු වුණි. එහෙත් ඒ කණ්ඩායම් අතුරෙන් ආබ්‍රහම්ගේ (ආබ්‍රම්) සංක්‍රමණය සිදු වූයේ හුදෙක් ලෞකික වුවමනාවක් නිසා නොව, දෙවියන් වහන්සේගේ නිශ්චිත පරමාර්ථයන් ඉටුකිරීමේ අරමුණෙනි. හාරාන් දේශයෙන්, ආබ්‍රහම් ඇතුළු පවුලේ සාමාජිකයන් කැඳවනු ලැබුවේ දෙවියන් වහන්සේ යි. හෙතෙම තම මව් බිම ද නෑදෑයන් ද පියාගේ ගෘහය ද සියල්ල හැරදමා මේ ගමනේ යෙදුණි. දෙවියන් වහන්සේට අප කීකරු වන විට අපට හුරු අපට අයිති සමහර සම්පත් අප විසින් පරිත්‍යාග කළ යුතුව තිබේ.

## ආබ්‍රහම්ගේ ඇදහිල්ල

ආබ්‍රහම් දේව කැඳවීමට දැක්වූ ප්‍රතිචාරයෙන් ඔහු තුළ එක ම දෙවියන් වහන්සේ කෙරෙහි ඇති ඒකාන්ත ඇදහිල්ල තහවුරු විය. හෙතෙම තමන් සතු සියල්ල ඉවත දමා දෙවියන් වහන්සේ කෙරෙහි පමණක් අදහමින් ජීවත්වීමේ අරමුණ වටහාගෙන ඒ අනුව ක්‍රියා කළේ ය.

මින් අපට පැහැදිලි වන වැදගත් කරුණු දෙකක් වන්නේ,

1. ඉශ්‍රායෙල් සමාජය එක ම දෙවියන් වහන්සේ අදහන හා එම ඇදහිල්ල මත ගොඩනැගුණු සමාජයක් බවයි.

2. එසේ ම එම සමාජයේ ආරම්භක ඉතිහාසය ආබ්‍රහම්තුමාගේ කැඳවීම සමග බද්ධ ව පවතින බවයි.

## ආබ්‍රහම් ලැබූ ගිවිසුම් පොරොන්දු

දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ගැඹුරු සම්බන්ධතාවකට ඇතුළු වූ සේක. මෙලෙස ඔහු ලත් කැඳවීමේ ඊ ළඟ පියවර දෙවියන් වහන්සේ ඔහු හා සමග ගිවිසුමකට එළඹීමයි. මේ ගිවිසුම තුළ ආබ්‍රහම් හා පසුව ඔහුගේ පෙළපතින් දෙවියන් වහන්සේ

කෙරෙහි ඇදහිල්ලෙන් හා කීකරුකමින් යුක්තව සිටීම දැකිය හැකි ය. දෙවියන් වහන්සේ ඔහුට හා ඔහුගේ පෙළපතට ආශිර්වාද කිරීම ගිවිසුමේ දෙවියන් වහන්සේගේ කොටස යි. මේ ආශිර්වාදය තුන් ආකාරයකින් පොරොන්දු තුළ අන්තර්ගත වේ. ඒවා නම්,

## (I) ඔහු විශාල ජාතියක පියා බවට පත්වීම (උත්පත්ති 12: 2, 13: 16, 15: 5)

ආබ්‍රහම් තමන්ට වයස අවුරුදු 99 දීත් දරුවකු නොසිටීම ගැන දෙවියන් වහන්සේට කරුණු කී ය. දෙවියන් වහන්සේ ඔහුට "පොළොවේ දූවිලි හා සමාන" මෙන් ම "අහසේ තාරුකා' මෙන් ගණන් කළ නොහැකි විශාල දරු පරපුරක් දෙන බව පොරොන්දු වූ සේක. එසේම ඔහුට දුන් අලුත් නාමයෙන් ඔහු ලැබූ විශේෂ තත්ත්වය හැඳින්වේ. ඔහුගේ මුල් නම "ආබ්‍රම්" ය. ඔහුට ආබ්‍රහම්" යන නාමය දෙනු ලැබුවේ ය. එහි අරුත "ජාතීන්ගේ පියා" යන්න ය.

## (ii) දේශයක උරුමය ලැබීම (උත්පත්ති 12: 7, 13: 15, 17: 8)

ආබ්‍රහම්, හාරාන් දේශයේ තම පියාගෙන් උරුම වූ සියල්ල අමතක කොට, දෙවියන් වහන්සේගේ කැඳවීමට කීකරු විය. සශ්‍රීක දේශයක උරුමය, දෙවියන් වහන්සේ ඔහුට දීමට ස්ථිර ලෙස ම පොරොන්දු වූ සේක.

## (iii) අන්‍යයන්ට ආශිර්වාදයක් වීම (උත්පත්ති 12: 2-3)

ආබ්‍රහම්ට හා ඔහුගේ පෙළපතට දෙවියන් වහන්සේගෙන් ආශිර්වාද ලැබුණි. එහෙත් දෙවියන් වහන්සේගේ අරමුණ ඉන් ඔබ්බට යන්නකි. මෙසේ ආබ්‍රහම්ට දෙවියන් වහන්සේ දුන් තුන්වෙනි පොරොන්දුව නම් "ඔහුගේ නාමය ආසිරි පැතීමේ නාමයක්" වන බවත්, එ තුළින් "මිහිමත සියලු දෙනා දෙවියන් වහන්සේගෙන් ආසිරි ලබන බවත් ය". මින් අදහස් වන්නේ ආබ්‍රහම් තම ඇදහිල්ල හා කීකරුකම තුළින් ලද ආශිර්වාදය හුදෙක් පෞද්ගලිකව ලැබූවක් පමණක් නොව, සමස්ත ලෝකවාසීන්ට ම හිමි වන සුවිසල් ආශිර්වාදයක් ලෙස ලැබූ බව යි.

මෙයාකාරයෙන් විකාශනය වූ ජන සමාජයට පසුකාලයේ දී දස පනත උපකාරී වූ අයුරු දැන් අපි සලකා බලමු.

## දස පනත තුළින් විනය ගරුක සමාජයක් (නික්මයාම 20: 1-17)

ඉශ්‍රායෙල් ජනතාවට දෙවියන් වහන්සේ දුන් දසපනත තුළ ජීවිතය හා සමාජය සඳහා අවශ්‍ය මූලික සාරධර්ම ගැබ් වී තිබේ. ඉශ්‍රායෙල් ජන සමාජය හා එහි සමාජ දර්ශනය මේ මත ගොඩ නැගී තිබේ.

දස පනත



## දස පනත හා එහි විශ්ලේෂණය

| | | | |
|---|---|---|---|
| 01 | මා හැර අන් කිසි ම දෙවි කෙනකු නුඹට නොසිටිය යුතු ය. | 05 | පියාට ද මවට ද ගෞරව කරව. |
| | | 06 | මිනී නොමරව. |
| 02 | නෙළූ රූපයක්... කිසිම වස්තුවකට සමාන දෙයක් සාදා නො ගන්න. ඒවාට නමස්කාර නො කරන්න. | 07 | කාමමිථ්‍යාචාරය නොකරව. |
| | | 08 | සොරකම් නොකරව. |
| 03 | දෙවි සමිඳාණන්ගේ නාමය අගරු ලෙස භාවිතා නො කරන්න. | 09 | අසල්වාසියාට විරුද්ධ ව බොරු සාක්ෂි නො කියව. |
| 04 | සබත් දවස ශුද්ධ ලෙස පැවැත්වීමට සිතට ගන්න. | 10 | අසල්වාසියා සතු කිසිවකටවත් ඇළුම් නොකරව. |

1, 2, 3, 4 -
මිනිසා හා දෙවියන් වහන්සේ අතර සබඳතාව හා මිනිසා දෙවියන් වහන්සේ සම්බන්ධයෙන් කළ යුතු පරම යුතුකම් හා වගකීම්

5, 6, 7, 8, 9, 10 -
මිනිසා හා මිනිසා අතර පැවතිය යුතු ගුණ ධර්ම හා මිනිස් සබඳතා මේ කොටසේ අඩංගු වේ.

මෙම විශ්ලේෂණයේ දෙවන කොටසේ පස්වන පනතට අනුව පවුලක පැවතිය යුතු දෙමාපිය හා දරු සබඳතාවල අර්ථවත් බව හා වටිනාකම පිළිබිඹු වන අතර අනෙකුත් අණපනත් ද ඉශ්රායෙල් සමාජය තුළ ක්‍රියාත්මක වීමෙන් එහි සමාජ දර්ශනය පෝෂණය වී තිබේ.

ජුදෙව් ජන සමාජය තුළ පැවති සාරධර්ම හා දේව ඇදහිල්ල ඉතා පුළුල් හා අර්ථවත් බවින් යුක්ත වෙයි. ලෝකය තුළ අප ක්‍රියා කළ යුත්තේ, පැහැදිලිව දේව සබඳතාවන් හා දෙවියන් වහන්සේට අප දක්වන කීකරුකම වර්ධනය කර ගැනීම තුළිනි. මෙවන් අර්ථවත්, යහපත් දිවි පෙවෙතක් සඳහා දස පනතින් අපට මූලික මග පෙන්වීමක් ලැබේ. එවිට සමාජය තුළ අප ක්‍රියාත්මක වන්නේ දේව අභිප්‍රායයන් ඉටු කරන දේව දරුවන් ලෙසට ය. මෙහි ප්‍රතිඵලය අප ජීවත්වන සමාජය යහපත් බවින් පූර්ණ වීම යි.

**ක්‍රියාකාරකම්**

01. 'ආබ්‍රහම්තුමාගේ ඇදහිල්ල අලුත් ජන සමාජයක් නිර්මාණය කිරීමට හේතු විය' ඊට නිදසුන් දක්වමින් සඟරාවකට ලිපියක් ලියන්න.

02. වත්මන් සමාජය ගුණවත් බවින් පිරුණු සමාජයක් බවට පත් කිරීමට ඉශ්රායෙල් සමාජයෙන් ගත හැකි කරුණු 4 ක් සඳහන් කරන්න.